# නූතන සිංහල සමාජය සහ විවාහය (වයඹ පළාත ඇසුරින්)

උදේනි ශ්‍යාමා හේරත්[1], ශාන්ති නිර්මලා අබේසිංහ [2]

නූතන සිංහල සමාජය හා සාම්ප්‍රදායික සිංහල සමාජය දෙස සංසන්දනාත්මකව විමසා බැලීමේදී විවාහ සංස්ථාව තුළ විවාහ ක්‍රම, විවාහ චාරිත්‍ර, සහකරුවකු/ සහකාරියක තෝරා ගැනීමේ දී සලකා බලන ප්‍රධාන කරුණු, විවාහයෙහි ආර්ථික චාරිත්‍ර සහ විවාහයෙන් ඇතිවන නව පවුල යන සාධක තුළ සුවිශාල වෙනස්කම් රැසක් සිදුව ඇත. මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ නූතන සිංහල සමාජය තුළ නව පවුලක් නිර්මාණය වීමේ දී ඉහත සඳහන් ප්‍රධාන කරුණු මූලික කොට ගෙන විවාහ සංස්ථාව තුළ සිදුවී ඇති වෙනස්කම් අධ්‍යයනය කිරීමයි.

පර්යේෂණ ක්‍රම අතර තුලනාත්මක ක්‍රමය මෙම අධ්‍යයනයේ ප්‍රධාන ක්‍රමවේදය ලෙස යොදා ගත් අතර ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා සහ ඉලක්ක ගත සමූහයන් සමඟ සාකච්ඡා කිරීම දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම ලෙස භාවිත කළෙමු. ස්තෘත සසම්භාව්‍ය නියැදි ක්‍රමය ඔස්සේ විවාහක පුද්ගලයන් 100 දෙනෙකු වයඹ පළාත ආශ්‍රයෙන් ඉහත අධ්‍යයනයෙහි නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී.

නාගරීකරණය, නවීකරණය, බටහිරකරණය වැනි දිගු කාලීන සමාජ චල්‍යතාවන් මුලික වෙමින් නූනත සිංහල සමාජය තුළ පවුල් සංස්ථාව පවත්වා ගැනීමට ආධාර උපකාර වන උප සංස්ථාවක් වන විවාහය විවිධ විපර්යාසයන්ට භාජනය වෙමින් පවතී. එමෙන්ම විවාහය යන්න නූතන සමාජය විසින් අපේක්ෂා

1 සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: udeni.herath@yahoo.com

2 සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: snasoci@yahoo.com

කරනු ලබන ධනය, බලය, ගරුත්වය යන සාධකයන්ට සමගාමීව විවිධ දිශානතීන්ට යොමු වෙමින් පවතී.

**ප්‍රමුඛ පද:** විවාහය, පවුල, සමාජ වෙනස්වීම, චාරිත්‍ර වාරිත්‍ර

**Title:** Contemporary Sinhalese society and marriage in North - Western province

**Keywords:** marriage, family, social changes, customs